**ශීර්ෂය 414 - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 21 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 06 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේ ස්ථාපිත වී ඇති බැවින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

---

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු. 234,100,000 ක් වූ අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එය රු. 526,972,639 ක් ලෙස දක්වා තිබුණි. | අමාත්‍යාංශයේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු. 234,100,000 ක් ලෙස දැක්වෙන්නේ වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා අමාත්‍යාංශ ශීර්ෂ අංක 414 ට අදාල ප්‍රමාණය වේ. | සියළු ගැලපීම් නිවැරදිව හදුනාගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව වෙනත් ලැබීම් රු. 4,030,227 ක් වූ අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට අනුව රු. 10,848,622 ක් ලෙස දක්වා තිබුණි. | අමාත්‍යාංශයේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වෙනත් ලැබීම් රු,4,030,227 ක් වූ ප්‍රමාණය සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබීම් වන අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු, 10,848,622 ක් ලෙස දැක්වෙන්නේ මුළු වර්ෂයටම අදාල ප්‍රමාණය වේ. | -එම- |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අමාත්‍යාංශයට අයත් පිළිමතලාවේ සහ බොරුල්ල පිහිටි පර්යේෂණ හා පුහුණු ආයතනයේ ඉඩම් ගොඩනැගිලි වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් තක්සේරු කොට මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කිරීමට මේවන විට පියවර ගෙන ඇත. | ඉඩම් ගොඩනැගිලි වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළයුතු විම. |
| (ආ) | ශිර්ෂ 124 යටතේ වර්ෂය ආරම්භයේ මූල්‍ය නොවන වත්කම් ශේෂය රු. 1,023,038,293 ක් වුවද, 2020 අගෝස්තු 31 දින ශිර්ෂ 414 ට හා වෙනත් ශිර්ෂවලට මාරුකිරීම් කිරීමේදී එම ශේෂය රු. 1,022,750,540 ක් වශයෙන් ගෙන මාරු කිරීම් කර තිබුණි. | 2021 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කළයුතු විම. |

## 1.6.3 අක්මුදල් ගැලපුම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 6 හි 7 (vi) ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන වාර්තාව අනුව වර්ෂය අවසානයේ | අක් මුදල් ගැලපුම් ගිණුම හා එයට අදාල සංඛ්‍යා ලබාගත් ආකාරය පිළිබඳව විස්තර (සටහනක් ලෙස) ඇතුළත්ව පිළියෙල කරන ලද අතර එය ඔබ වෙත ඉදිරිපත් කරන ලදී. | සියළු ගැලපීම් නිවැරදිව හඳුනාගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයට පියවිය යුතු/ ලැබිය යුතු වටිනාකම හා මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අගය වෙනස් අගයක් ගන්නා බැවින් එම ශේෂයන් සැසඳීම සඳහා අක් මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | | |
| (ආ) | ශීර්ෂ අංක 124 යටතේ 2020 අගෝස්තු 31 දිනට නොපියවූ අතුරු අග්‍රිම ශේෂය රු.612,048 ක් ජ'නල් සටහන් මඟින් පියවීම් ලෙස දක්වා තිබුණද, සිගාස් වැඩසටහන තුළ පවරා ගැනීමක් දක්වා නොතිබුණි. | රු.612,048 ක වෙනසක් ලෙස මෙහි දැක්වෙන්නේ 2020.08.31 දිනට කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතේ පැවති කාලයේ නොපිය වූ අතුරු අග්‍රිම ශේෂයයි. මෙය වර්ෂය අවසානයේ පියවීමට කටයුතු කරන ලදී. | -එම- |

**1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------ | --------------------------- | ---------- |
| (අ) | මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාල නොවන වැය ශීර්ෂ අංක 124 යටතේ 2020 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළ අග්‍රිම ලැබීම් හා වෙනත් ලැබීම් එකතුව රු.299,691,034 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සම්පූර්ණ වර්ෂයට අදාල ලැබීම් සටහන් කර ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාල නොවන වැය ශීර්ෂ අංක 124 යටතේ පියවන ලද රු. 12,430,496 ක අග්‍රිම මුදල සහ ශීර්ෂ අංක 414 යටතේ නොපියවූ අග්‍රිම ශේෂය රු. 2,241,772 ක එකතුව වූ රු. 14,672,268 ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සම්පූර්ණ වර්ෂයට අදාලව සටහන් කර ඇත. | - එම - |
| (ඇ) | අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.5,762,582 ක් සහ රු. 5,228,870 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට එය පිළිවෙලින් රු.14,605,406 ක් සහ රු.9,372, 330 ක් ලෙස ගලපා තිබුණි. | අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති ලැබීම් හා ගෙවීම් සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මාසයට අදාලව සඳහන් කර ඇති අතර මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මුළු කාලයටම අදාල ප්‍රමාණය දක්වා ඇත. | - එම - |
| (ඈ) | තැන්පතු ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.1,011,394 ක් සහ රු.1,510,581 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය පිළිවෙලින් රු.13,193,843 ක් හා රු.4,999,220 ක් ලෙස දක්වා තිබුණි. | තැන්පතු ගිණුමේ දක්වා ඇති ලැබීම් හා ගෙවීම් සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මාසය දක්වා සඳහන් කර ඇති අතර මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මුළු කාලයටම අදාල ප්‍රමාණය දක්වා ඇත. | -එම - |

**1.6.5 අග්‍රිම ශේෂය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ACA – 3 ආකෘතියේ අග්‍රිම ලැබීම රු.526,100,000 ක් ලෙස දක්වා තිබුණ ද දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.234,100,000 ක් විය. භාණ්ඩාගාර ශේෂ පිරික්සුම අනුව අග්‍රිම පියවීම (වියදම් මඟින්) රු.112,122,848 ක් | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් සහ පියවීම් පිළිවෙලින් රු.526,100,000 ක් හා රු.521,005,249 ක් ලෙස ඇතුළත් කරන ලද්දේ සමාලෝචිත වර්ෂයට අදාල වන ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ අගයන් අනුව වේ. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව නිවැරදිව මූල්‍ය ප්‍රකශන ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වුවත්, ACA – 3 ආකෘතියේ රු.521,005,249 ලෙස දක්වා තිබුණි. | | |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු අග්‍රිම ශේෂය රු. 2,241,772 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශන සමඟ අග්‍රිම ගිණුම පිළිබඳ ඉදිරිපත් කර ඇති ACA -3 ආකෘතියේ 2020 දෙසැම්බර් 31 පියවිය යුතු ශේෂයක් නොමැති බව දක්වා තිබුණි. | 2020.12.31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය වන රු.2,241,772 ක මුදල 2021 ජනවාරි 02 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල බැවින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පෙන්වා ඇත. | -එම-. |

### 1.6.6 අත්තිකාරම් ගිණුම් ශේෂ

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA-50 ප්‍රකාරව අත්තිකාරම් ලැබීම් රු. 14,384,773 ක් වූ අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එය රු.24,751,602 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.24,751,602ක් ලෙස අත්තිකාරම් ගෙවීම් දැක්වෙන්නේ මුළු වර්ෂයටම අදාල ප්‍රමාණය වේ. | සියළු ගැලපීම් නිවැරදිව හඳුනාගෙන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA-50 ප්‍රකාරව අත්තිකාරම් ගෙවීම් රු. 66,838,390 ක් වූ අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට අනුව එය රු. 70,894,121 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.70,894,121ක් ලෙස අත්තිකාරම් ගෙවීම් දැක්වෙන්නේ මුළු වර්ෂයටම අදාල ප්‍රමාණය වේ. | එම - |

**1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි ගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i) හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | හානි හා පාඩු ලේඛණය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| **(ii) බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | 2020 වර්ෂයේ මාස 09 ක් පැවති Covid 19 වසංගත තත්ත්වය නිසා නිලධාරින්ගේ පැමිණීම අඩාල වූ අතර ප්‍රමාණාත්මක බැරකම් පමණක් හැකිතාක් හඳුනාගෙන බැරකම් හා බැදීම් ලේඛණයේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අමාත්‍යාංශය බදු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර සියළු නඩත්තු කටයුතු බදුකරු විසින් දරනු ලැබේ. එසේ තිබියදී ගොඩනැගිලි ඉදිකිරීම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම, නඩත්තු කටයුතු සඳහා අයවැය ප්‍රතිපාදන මඟින් වැය විෂයයන් 3 ක් සඳහා එකතුව රු.2,690,000 ක් වෙන්කර තිබුණි. මෙම ප්‍රතිපාදිත මුදලින් රු.2,227,681 ක් එනම් සියයට 82.8 ක් ඉතිරිවී තිබුණි. ඒ අනුව අවශ්‍යතා හඳුනා නොගෙන ඒ ඒ වැය විෂය සඳහා ප්‍රතිපාදනය වෙන්කර ගෙන තිබුණි. | අමාත්‍යාංශ සංශෝධනය අනුව ග්‍රාම ශක්ති අංශය ඇතුළු විවිධ අංශ මෙම අමාත්‍යාංශය වෙත පැවරිණි. එසේ පැමිණි නිලධාරීන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා ගැනීමට කටයුතු කළයුතු වුව ද Covid 19 වසංගත තත්ත්වය නිසා සළසාගත් ප්‍රතිපාදන අනුව සම්පත් අත්පත් කර ගැනීමට නොහැකි විය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ විසින් අවස්ථා 22 ක දී ලබාගත් විවිධ සේවාවන් හා සැපයුම්වලට අදාලව රු. 2,906,207 ක බැරකම් වටිනාකම බැරකම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | රටේ පැවති Covid 19 වසංගත තත්ත්වය මත මූල්‍ය ප්‍රකාශ සකස්කරනු ලබන කාලය ඇතුළත වගකීම්වලට එළඹී සිටියද සියළු බැදීම් හඳුනා ගැනීමට නොහැකි විය. පසුව භාණ්ඩ හා සේවා ලබා ගෙන ඇති ගෙවීම් හඳුනාගත් අතර ඒ සඳහා ගෙවීම් කිරීමට සිදු විය. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව බැදීම්වලට එළඹිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සීදූව සමාජ සංවර්ධන ආයතනයේ ගොඩනැඟිලි ඉදිකිරීම් සඳහා වූ ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 1,000 ක් වූ අතර 2018 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රකාශනවලට අනුව වියදම රු.මිලියන 589.29 ක් විය. තවදුරටත් ගෙවිය යුතු වටිනාකම වූ රු.මිලියන 410.707 ක් බැඳීම් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි. | සීදූව සමාජ සංවර්ධන ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකිරීම වසර 03 ක් දක්වා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතියක් වන අතර Coved 19 වසංගත තත්ත්වය නිසා මෙය අවසන් කිරීමට නොහැකි විය. ඉදිරියේ දී ඉදිකිරීමට ඇති ගොඩනැගිලි වටිනාකම් ගිණුම්වල පෙන්විය නොහැකි බැවින් මෙය බැරකම් ලේඛණයට ඇතුළත් නොකරන ලදී. | -එම- |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 1647 (අ) හා 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (**1**) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහන 50 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ වාහන සම්බන්ධ සමීක්ෂණයට අදාල ආකෘති පත්‍රය සකසා ඇති අතර ඒ සම්බන්ධ ඉදිරි කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 4 ක එකතුව රු. 53,441,266 ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂ 1 ක සිට වර්ෂ 4 ක් අතර කාලයක් පැරණි රු. 2,864,223 ක් තැන්පතු ශේෂයන් විය. | 2020 වර්ෂයේ සීමිත කාර්යය මණ්ඩලයක් කැඳවමින් අත්‍යවශ්‍ය රාජකාරි ඉටුකරගත් අතර තැන්පත් ගිණුමේ වර්ෂ කිහිපයක් පුරා පැවති ශේෂයන්ට ගතයුතු ක්‍රියාමාර්ග මග හැරුණි. ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රාජ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකල යුතු කාර්යයන් හා කර්තවයන්ද සුවිශේෂී ප්‍රමුඛතා 5 ක් ද හඳුන්වා දී තිබුණි. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය පුළුල් කිරීමත්, නව ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය දීර්ඝකාලින බදු පදනම යටතේ ලබා දෙන ඉඩම්, ණය පහසුකම්, ව්‍යාපාර උපදේශනය, තාක්ෂණික හා යටිතල පහසුකම් ආදී සියල්ලම පහසුවෙන් ලබා දෙන විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමත්, සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා එක් ආයතනයක් මගින් සියළු සේවා සැපයීමේ ක්‍රමවේදයක් සකස් කිරිමත් හා එම | මෙහි සඳහන් විශේෂිත ආයතන 03 ම සමාගම් පනත යටතේ ලියාපදිංචි හා භාණ්ඩාගාරයට සියළු අයිතිය හිමි රාජ්‍ය සමාගම් වේ. මෙම ආයතන 03 මෙම අමාත්‍යාංශයට පැවරෙන අවස්ථාවේ දී පූර්ව වර්ෂ 05 කට අදාල අවසාන ගිණුම් සකස් කිරීම ඇතුළුව ආයතන 03 ට ක්‍රියාකාරි මට්ටමට පත් කර ගැනිම සඳහා මෙම අමාත්‍යාංශය විසින් ගතහැකි උත්සහයන් දැරූ බව කාරුණිකව දන්වමි. මීට අදාල කරුණු ඔබ වෙත නිරීක්ෂණය වී නොමැති බැවින් අදාල ගොනුවේ ඡායා පිටපත් කට්ටලයක් මේ සමඟ එවමි. | අමාත්‍යාංශය විසින් සිදුකල යුතු කාර්යයන් හා කර්තවයන්ට අදාල මෙහෙයුම් කටයුතු සිදු කල යුතු විම. |

ක්ෂේත්‍රවලට අගය වැඩි කිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබාදීමත් යන සුවිශේෂී ප්‍රමුඛතාවයක් ක්‍රියාත්මක කිරීමත් අපේක්ෂාකර තිබුණි. එම කාර්යයන් සඳහා අමාත්‍යාංශය වෙත පාලන බලය පවරූ ව්‍යවස්ථාපිත ආයතන 3 ක් වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය සහ රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව යන ආයතනවල මෙහෙයුම් ක්‍රියාකාරීත්වය අමාත්‍යාංශය පිහිටුවා මාස 6 ක් ගත වී ඇතත් ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි .

## 3.2 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ග්‍රාම ශක්ති කාර්යාංශය** | | |
| 2020 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ග්‍රාම ශක්ති කාර්යාංශය සඳහා රු. මිලියන 325.92 ක් වෙන්කර තිබූ අතර එම ප්‍රතිපාදනවලින් මිලියන 320.92 ක් එනම් සියයට 98 ක්ම 2019 වර්ෂයේ සිදුකරන ලද ව්‍යාපෘතිවලට අදාළ අතැති බිල්පත් ගෙවීම සඳහා විය. එම බිල්පත්වලින් රු. මිලියන 224.22 ක් සමාලෝචිත වර්ෂයේදී පියවා තිබුණි. | 2020 වර්ෂයේ මුල් මාස 08 ක කාලයේ දී ග්‍රාම ශක්ති කාර්යංශය ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පැවති අතර 2020 අගෝස්තු 01 දිනෙන් පසු මෙම අමාත්‍යංශය වෙත පැවරිණි. මෙහි සඳහන් රු.මිලියන 320.92 ක මුළු මුදලම 2019 වර්ෂයේ ඇති කර ගත් ගිවිසුම් හා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ වගකීම් වෙනුවෙන් විවිධ ආයතන වලට නිරවුල් කළ යුතු බිල්පත් සඳහා රාජ්‍ය ආයතන මඟින් කරන ලද ඉල්ලීම් පදනම් කර ගෙන නිරවුල් කරන ලද බව කාරුණිකව දන්වමි. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ජාතික සමාජ සංවර්ධන ආයතනය**<br>------------------------------<br>2020 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් සිදුව නව ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 16.900 ක් වෙන්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 6.5 ක් එනම් සියයට 23 ක් විය. | මුල් අවස්ථාවේ දී B පර්යන්තයේ වැඩ අවසන් කර ආයතනය එම ගොඩනැලිල්ලට ගෙන ගිය අතර සමස්ථ ගොඩනැගිලි සංකීර්ණය සඳහාම උපකරණ මිලදී ගැනීමට වෙන් වූ මුදලින් වැඩ නිම කල කොටස්වලට අදාල උපකරණ පමණක් මිල දී ගන්නා ලදී. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඇ) | **ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂන ආයතනය (පිළිමතලාව හා බොරැල්ල)**<br>--------------------------------<br>ආර්ථික හා සමාජීය මානසික අගාධයට වැටී සිටින ග්‍රාමීය දිළිඳු ජනවතාවගේ දිළිඳුකම පිටු දැකීම හා ග්‍රාම සංවර්ධන කටයුතු දියුණුකිරීම මඟින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදීම මෙම ආයතනයේ මූලික අරමුණ විය. මේ සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ක්‍රියාකාරකම් 10 ක් වෙනුවෙන් රු. මිලියන 16.02 ක් වෙන්කර තිබූ අතර එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 9.07 ක් විය. ආයතනයේ මූලික අරමුණ ඉටු කර ගැනීමට ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු වෙනුවට රු. මිලියන 8 ක් වැය කර කාර්යාල උපකරණ මිලදී ගැනීම හා ගොඩනැගිලි අළුත්වැඩියාවන් කර තිබුණි. | බොරැල්ලේ පිහිටි ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය ඉතා පැරණි ගොඩනැගිල්ලක් බැවින් එහි අළුත්වැඩියා කටයුතු අදියර කිහිපයක් යටතේ නිම කරන ලද අතර දැනට ඇත්තේ අවසන් අදියරෙහි කටයුතු පමණි. අළුත්වැඩියා කටයුතු අවසන් වූ නේවාසිකාගාරය, ප්‍රධාන රැස්වීම් ශාලා 02 ක්, ආපන ශාලාව හා රැස්වීම් ශාලාවට පිවිසුම් මාර්ගය දැනට වැඩ නිම කර ඇත. ඒ අනුව බාහිර හා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇති බැවින් අපේක්ෂිත අරමුණු ඉටු වෙමින් පවතී. | එම - |

**3.3 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජුලි 10 දිනැති අංක 2/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දී ඇති උපදෙස් ප්‍රකාරව අපහරණය සිදුකිරීම සහ 2018 මාර්තු 19 දිනැති අංක 1/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව ධාවනය කල නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කිරීම කළයුතු බව දක්වා තිබියදී අමාත්‍යාංශයේ සතු වාහන 5 ක් සම්බන්ධයෙන් 2021 මැයි මස වන විටත් අපහරණ කටයුතු සිදු කර නොතිබුණි. | පිළිතුර නිරීක්ෂණයට අදාළ නොවේ. | චක්‍රලේඛ මඟින් දි ඇති දී ඇති උපදෙස් ප්‍රකාරව අපහරණ කටයුතු සිදු කල යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තෘතීක හා ද්විතීක මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු පිළිවෙලින් 17 ක් හා 18 වශයෙන් අනුමත වුවද තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 289 ක් හා 53 ක් වීම හේතුවෙන්, අනුමත ප්‍රමාණය ඉක්මවා 307 ක් සේවයේ යොදවා තිබුණි. | ඉහත අනුමත ප්‍රමාණයට වඩා අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය සිටින බැවින්, දැනට සිටින කාර්යය මණ්ඩලය ද ඇතුළත්ව යෝජිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා මාගේ අංක SMS/ADM/1/2/1-2019 හා 2021 ජනවාරි 19 හා 2021 පෙබරවාරි 11 දිනැති ලිපි මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මෙතෙක් පිළිතුරු නොලැබුණ බව කාරුණිකව දන්වමි. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/02 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ 05 ඡේදය අනුව මෙම අමාත්‍යාංශය ජනතා කේන්ද්‍රීය රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සඳහන් කාර්යයන්, කර්තාව්‍යයන්, ප්‍රමුඛතාවයන් සහ ඊට අදාල ඉලක්ක ලගා කර ගැනිමේදී අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල දායකත්වයක් අවශ්‍ය වන බව හඳුනාගෙන තිබුණි. තවද එම කරුණු සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම් කල යුතු වූ අතර ඒ සඳහා විධිමත් පරිදි යෝජනා ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් නොවීය. | අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |